හෝමාගම ප්‍රාදේශීය සභාව
කොළඹ දිස්ත්‍රික්කය
-----------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන
---------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුලි 08 දින සභාවේ ලේකම්වරියට යවා ඇත.

**1.2** තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

**1.3.1** ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ලේඛනාගාර ගොඩනැගිල්ලේ ගින්නෙන් සිදු වූ අලාභය රු.1,202,867 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදි රු.413,000 කට වෙන්දේසි කර විකුණා තිබූ වාහන දෙකෙහි ගත් මිල වාහන ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු.23,265,026 ක් වූ ප්‍රජාශාලා හා ආදාහනාගාර ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් මාසයේ බැංකුවට සෘජු ලෙස ලැබුනු රු.1,530,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) අස්ථාන ගත වූ පුස්තකාල පොත් 1261ක වටිනාකම රු.272,615 ක් ගිණුම් වල ගැලපීම් නොකිරීම නිසා තොග ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
---------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාලව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.22,307,800 ක් වූ අතර ඒවාට අදාල උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු.21,354,259 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

වටිනාකම රු.1,805,378 ක් වූ විගණන විමසුම් 01 ක් සඳහා 2017 සැප්තැම්බර් 15 වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.13,094,930 ක් වූ ගණුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.124,665,116 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.125,868,478 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2016 | | | | 2015 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් විෂයය** | **2016 ජනවාරි 01 දිනට හිඟ ශේෂය** | **වර්ෂයේ බිල් කිරීම** | තථ්‍ය අයකර ගැනීම | **2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** | **2015 ජනවාරි 01 දිනට හිඟ ශේෂය** | **වර්ෂයේ බිල් කිරීම්** | තථ්‍ය අයකර ගැනීම | **2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 18,614,799 | 16,642,466 | 22,204,858 | 13,720,707 | 49,580,012 | 33,395,852 | 39,130,776 | 43,952,848 |
| කඩකුලී | 1,207,612 | 5,060,300 | 5,621,955 | 610,808 | 4,098,764 | 5,176,350 | 7,697,306 | 1,577,808 |
| විනෝද බදු | 37,812 | 339,659 | 322,216 | 55,254 | 67,115 | 601,720 | 633,920 | 34,905 |

2.2.2 වරිපනම්

----------

සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.13,720,707 ක් වූ වරිපනම් බදු හිඟය තුළ වර්ෂ 05 ට වැඩි කාලයක් හිඟ හිටි රු.1,029,048 ක ශේෂයක් පැවතුනු අතර එය මුළු හිඟයෙන් සියයට 8ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මියගිය, සේවය හැර ගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතුව තිබූ මුදල රු.623,981 ක් විය. ප්‍රවර්තන වර්ෂයේදීද මෙම ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ ලෝක බැංකු ආධාර යටතේ පොලීතින් කුට්ටි කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට ලබා දී තිබූ බේලින් යන්ත්‍රය, 2017 මැයි මස වන විටත් සභාව විසින් එකතු කරනු ලබන පොලීතින් කුට්ටි කර හොල්සිම් ආයතනය වෙත ලබා දීම සඳහා යොදවා ගෙන නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

වටිනාකම රු.34,564 ක විදුලි භාණ්ඩ, වටිනාකම රු.590,625 ක මෝටර් ග්‍රේඩරය සහ වටිනාකම අනාවරණය නොවූ විදුලි ජනක යන්ත්‍රය හා ට්‍රැක්ටරයක් 2016 දෙසැම්බර් 31 දිනට ඌණ උපයෝජිතව පැවතුණි.

3.3 හඳුනාගත් අලාභ

-------------------

(අ) වැතර උපකාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී වටිනාකම අනාවරණය වූ ලැප්ටොප් පරිඝණක 02 ක, සාමාන්‍ය පුටු 09 ක, යතුරු ලියනයක හා ප්ලාස්ටික් ඇඳි රහිත පුටු 38 ක ඌණතාවක් විය.

(ආ) ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ තිබූ රු.154,206 ක් වටිනා කොඩි කණු 156 ක් ඌණව තිබුණි.

(ඇ) අස්ථානගත වූ පොත් 1261 ක එකතු වටිනාකම රු.272,615ක් විය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල කර්මාන්ත 574 කින් වටිනාකම රු.8,616,862 ක් වූ කර්මාන්ත 20 ක් අතහැර දමා තිබූ අතර, වටිනාකම රු.75,791,033 ක් වූ කර්මාන්ත 113 ක වැඩ අවසන් වී නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය
---------------------------------------

(අ) අයවැය පාලනය
-------------------

අයවැය හා සත්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) අභ්‍යන්තර විගණනය
------------------------

2016 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩ සටහන විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
------------------------------

2016 වර්ෂයේ පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත 281 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද ඉන් ක්‍රියාත්මක කර තිබුණේ කර්මාන්ත 39ක් පමණි. එසේ වුවද ක්‍රියාකාරි සැලැස්මෙහි නොමැති වෙනත් කර්මාන්ත 441 ක් සමාලෝචිත වර්ෂය තුලදි ක්‍රියාත්මක කර තිබුණි. මේ අනුව සභාව විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල ද ඒ අනුව කටයුතු නොකරන බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
-----------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) අභ්‍යන්තර විගණනය